## 2.13 විශ්වවිද්‍යාල ශිෂ්‍ය ගැටුම් කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳ අධ්‍යයනය

සුගත් තුෂාර ජයසේන [1]

ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

---

## ABSRACT

වර්තතමානයේ විවිධාකාරී ගැටුම් විශ්වවිද්‍යාල තුළ හඳුනාගත හැකයි එය විශ්වවිද්‍යාල පද්ධති පවත්වා ගැනීමේදී මුහුණදෙන ප්‍රධාන ගැටලුවක් බවට පත්වී ඇති අතර විවිධ යුගයන් හිදී විවිධ හේතු පදනම් කරගෙන ගැටුම් වර්ධනය වී ඇත. විශ්වවිද්‍යාල ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන සාධකයන් හඳුනා ගැනීම අධ්‍යයනයේ අරමුණ වේ. මේ පිළිබඳ අධ්‍යයන කිරීමේදී, අහඹු ලෙස තෝරාගත් කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හතර නියෝජනය වන ආකාරයෙන් සිසුන් සියදෙනෙකුගේ නියැදියක් යොදගෙන සම්මුඛ සාකච්ජා කළ අතර නිරීක්ෂණ ක්‍රම ඔස්සේ ද කරුණු අධ්‍යයන කරන ලදී.

ගැටුම සඳහා හේතුවන ප්‍රධාන සාධක ලෙස සමාජ, දේශපාලන සහ ආර්ථික සාධක හේතුවන බව මෙම අධ්‍යනය තුළින් හඳුනා ගෙන ඇත. එහිදී පවතින දේශපාලන පක්‍ෂවල වුවමනාවන් සඳහා සරසවි යොද ගැනීම, මෙන්ම ශිෂ්‍යයන්ගේ ආර්ථිකමය සාධක ද ශිෂ්‍ය ගැටුම් ඇතිවීම සඳහා ඍජු බලපෑමක් ඇති කරන බව අධ්‍යයනය තුළින් පැහැදිලිවේ. මෙම තත්ත්වය වඩාත් උත්සන්න කිරීම සඳහා හදාරනු ලබන පාඨමාලා රැකියාභිමුඛ නොවීම සහ සමාජ ප්‍රචණ්ඩත්වය ඉහළයාම සහ පවුල් පරිසරයන් තුළ පවතින ප්‍රචණ්ඩ අත්දැකීම් බෙහෙවින් බලපා තිබේ. එමෙන්ම විශ්වවිද්‍යාලය තුළ මතවාදිමය සංවාද සඳහා වේදිකාවක් නිර්මාණය නොවීම ගැටුම් සඳහා ඍජු දයකත්වයක් සපයන බව අධ්‍යයනය තුළින් හෙළිදරව් වේ.

**Key words**: ශිෂ්‍ය ගැටුම, ප්‍රචණ්ඩත්වය, මතාවදිමය සංවාද, දේශපාලන පක්ෂ, විශ්වවිද්‍යාල